


# හෙළ කත හැඳි වත



ප්‍රසුගිය දිනවල සිඩ්නි නගරයේ කලා සංස්කෘතික ජීවිතයේ වූ සිදුවීමක් කෙරෙහි කලාකාමීන් බොහෝ දෙනෙකුගේ අවධානය යොමුවිය. ඒ සිදුවීම නම් විවෘත කිරීමට මොහොතකට පෙර ඡායාරූප ප්‍රදර්ශනයක් තහනම් කිරීමයි. ඒ ප්‍රදර්ශනය සංවිධානය කර තිබුනේ බිල් හෙන්සන් (BILL HENSON) නැමැති සුප්‍රකට කලාකරුවකු විසිනි. තහනම් කිරීමට හේතුව එම ඡායාරූප ප්‍රදර්ශනයට ලාබාල දැරියකගේ නිරුවත් ඡායාරූප ඇතුලත් කර තිබීම යයි බලධාරීන් පවසා තිබිණ. එම නිරුවත් ඡායාරූප 'අසභ්‍ය' ලෙස හඳුන්වා දී තිබිණ. අහිංසක දැරියන්ගේ උඩුකය දැක්වෙන එම ඡායාරූප හොඳ කලාත්මක නිර්මාණයක් ලෙස ඉදිරිපත් කර තිබූ බවය බොහෝ කලාකරුවන්ගේ මතය වූයේ.

උඩුකය නිරාවරණය වූ කාන්තා රූප 'අසභ්‍ය' ලෙස මෙසේ හඳුන්වා දී ඇතත් අපේ පැරණි සිංහල සාහිත්‍ය කලා දෙස හැරී බලන විට පෙනී යන්නේ පැරණි සිංහල කුල කාන්තාවන් උඩුකය නොවැසූ බවය. සිංහල ස්ත්‍රීන් උඩුකය නොවසා ඉනෙන් පහල වසා රෙදිපිළි ඇඳගෙන නොයෙක් අබරණින් හිස, මුහුණ හා ගෙල අලංකාර කරගත් බව පැරණි සිංහල සාහිත්‍ය පොත පත පෙරළීමේදී පෙනී යයි. සීගිරි සිතුවම් නිරූපණය කරන්නේ උඩුකය නොවැසූ කාන්තා රූප රැසකි. ඉසුරුමුණියේ සුප්‍රසිද්ධ 'පෙම් යුවල' නිරූපණය කරන ගල් පිලිමයේ කාන්තා රූපයේ උඩු කය වසා නැත.

තිසර සන්දේශයෙන් 51 වන පද්‍යය පහත දැක්වේ. එම පද්‍යයෙන් කියන්නේ මොරටු එළියේ ගොපලු ලඳුන් පියයුරු මනාව දර්ශනය වන පරිද්දෙන් උඩුකය නොවසා දණින් උඩ පමණක් වැසෙන පරිද්දෙන් දුහුල් ඇඳුමකින් සැරසී සිටිය බවයි.

"ලෙලවා තන බර ගන රන් කුඹු වැනි
දන නෙත් වෙළියේ
දුහුලැද උඩු දණ මඬල ද සිරිසර
පාමින් එළියේ
ගෙරි නවතා යනෙන ගොපලු අඟනන් දැක
තුනු හෙළියේ
නෙතු සිතු සනසමින් සබඳ නොළඟව
මොරටුව එළියේ"

පැරණි සිංහල සාහිත්‍ය පොතක් වන 'ධම්පියා අටුවා ගැට පදය' ක්‍රි. ව. 908 දී ලංකාවේ රජ කළ පස්වන කාශ්‍යප රජතුමා විසින් කරන ලද්දක් බව ප්‍රකටය. එහි එන රෝහිණී වස්තුවේ එක් පාඨයක් මෙකල ව්‍යවහාර වන සිංහල භාෂාවෙන් ගත් කල මෙසේය. "රෝහිණී තම ඡවි රෝගය වසා ගැනීමට පෙරවී පට සැට්ටය තෙරුන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් උනා තබා උන්වහන්සේ වෙතට පැමිණියාය." (සිංහල සාහිත්‍ය ලිපි - ශ්‍රීමත් ඩී. බී. ජයතිලක. පිට 1:2007) එකල සිංහල කාන්තාවන් ගරුකටයුතු පුද්ගලයන් ඉදිරියට යාමේදී උඩකය නොවසා ගිය බවයි මේ පාඨයෙන් පෙනෙන්නේ.

වික්ටෝරියානු සදාචාරයේ ගිලී ඇති මෙකල අප, උඩකය නිරාවරණය කරගත් කාන්තාවක වැදගත් පුද්ගලයෙකු ඉදිරියට යාම සලකන්නේ මහත් අශීලාචාර කමක් ලෙසය. කාලයත් සමග සිංහල කාන්තාවගේ ඇඳුමේ වූ පරිණාමය මේ අනුව සිතා ගත හැකිය.

උම්මග්ග ජාතකයෙහි 'ස්ත්‍රී ප්‍රශ්ණය' නැමැති කතාවෙහි මෙසේ දැක්වේ.
"....... මහ බෝසතාණන් වහන්සේ නුවරින් එන සේක ම, මසු දහසක් හා එක් සීන් කඩක් හා බුලත් පයියෙහි ලා වැඩි සේක. උන් වහන්සේ ඒ කඩ මෑත් කොට අමරා දේවීන් අත තබා 'සොඳුර, තොප ගේ යෙහෙළියන් සමග ගොසින් නා පියා මේ කඩ ඇඳගෙන එව' යි වදාළ සේක....."

උම්මග්ග ජාතකයේ එන මේ පාඨය අනුව තුන් වගයම එක් කොට අඹරා ඇඟ මුළුල්ලේ ගල්වා දොර අව්වෙහි නිරුවත් සිටගෙන සිටි අමරා දේවියට මහ බෝසතුන් දුන්නේ එක් රෙදි කඩක් පමණි. මෙයින්ද පෙනී යන්නේ එකල සිංහල කුල කත උඩුකය නොවැසූ බවය.

තොටගමුවේ රාහුල හිමියන් 15 වන සියවසේදී ලියූ කාව්‍යශේඛර මහා කාව්‍යයේ පසවන සර්ගයෙහි එන 6 වන හා 12 වන පද දෙක මෙසේය.

6. ගසමින් කාගේ වැටි
තැවරූ ඇඟ කසා මැටි
ගම්වැසි ලියන් සැටි
බැලී මහසත් මඟ යමින් සිටි

12. දිය කෙළෙනා නිබඳ
මාලව ළඳුන් මනනඳ
පියොවුරු සඳුන් වැද
සුදුව බැබළී ගසන රළකඳ

ගම්වැසි ලියන් උඩුකය නොවැසූ බව හයවැනි පදයෙන් පෙනේ. දිය කෙළින් ළඳුන් පවා මෙකල මෙන් දියරෙදි ඇදිගෙන නොව නිරාවරණය වූ උඩුකය ඇතිව දිය නෑ බව දොලොස්වන පදයෙන් ද පෙනී යයි.

පහත දැක්වෙන කාව්‍යශේකරයේ දස වන සර්ගයේ එන 17 වන පදයෙන් හෙළිවන්නේ ද එකල සිංහල කාන්තාව උඩු කය නොවැසූ බවය. උතුරු සළුපට නැතිව ගෙයින් පිටතට නොයන ලෙස පිය බමුණා දියණියට අවවාද කළේ මේ නිසාය.

"නොකියා සිය හිමිට
නැතිව ද උතුරු සළුපට
ගමන් ඉක්මන් කොට
නොයන් නුඹ වසන ගෙන් පිටතට"

පැරණි සිංහල සාහිත්‍ය පොත පත පෙරළීමේදී පෙනෙන මෙවන් තොරතුරුවලින් හෙළිදරව් වන්නේ අපේ සිංහල කුල කාන්තාව උඩ කය නොවසා සිටි බවය. මෙකල නම් ලෝකයේ කවර රටක වුවද පියයුරු නිරාවරණය වන සේ උඩුකය නොවසා සිටින කාන්තාවන් අශිෂ්ඨ සමාජයක ජීවත්වන්නන් ලෙස ඇතැම් අයකු විසින් සලකනු ලැබේ. සමාජයේ දියුණුවත් පරිණාමයත් සමග ශිෂ්ඨ හා අශිෂ්ඨ යන සංකල්පය ද වෙනස් වෙයි.

එය වනාහි ඕනෑම සමාජයක භාෂාව, සිරිත් විරිත්, ඇදහිලි සිතුම් පැතුම්, අදහස් උදහස් වෙනස් වන්නාක් මෙන් වෙනස් වන ස්වාභාවික සංසිද්ධියකි. කලාකරුවා මේ වෙනස දකින්නේ කලාත්මක ස්වරූපයෙනි. කලාකරුවාගේ කලාත්මක නිර්මාණය තත්කාලීන සමාජ සම්මතයන්ට හැමවිටම එකඟ නොවන්නම පුළුවන. සැමවිටම තත්කාලීන සමාජ විඥාණයට වඩා ඉදිරියෙන් සිටින කලාකරුවකු අළුත් නිර්මාණයක් කළ විට මහත් සමාජ ආන්දෝලනයක් ඇතිවීමට ඉඩ තිබේ. බිල් හෙන්සන් (BILL HENSON) ගේ ඡායාරූප ප්‍රදර්ශණ තහනමත් මෙවන් සිදුවීමක් ලෙස සැලකිය නොහැකි ද ?

පැරණි සිංහල සාහිත්‍ය පොත පත පෙරළීමේදී පෙනෙන මෙවන් තොරතුරුවලින් හෙළිදරව් වන්නේ අපේ සිංහල කුල කාන්තාව උඩ කය නොවසා සිටි බවය. මෙකල නම් ලෝකයේ කවර රටක වුවද පියයුරු නිරාවරණය වන සේ උඩුකය නොවසා සිටින කාන්තාවන් අශිෂ්ඨ සමාජයක ජීවත්වන්නන් ලෙස ඇතැම් අයකු විසින් සලකනු ලැබේ. සමාජයේ දියුණුවත් පරිණාමයත් සමග ශිෂ්ඨ හා අශිෂ්ඨ යන සංකල්පය ද වෙනස් වෙයි. එය වනාහි ඕනෑම සමාජයක භාෂාව, සිරිත් විරිත්, ඇදහිලි සිතුම් පැතුම්, අදහස් උදහස් වෙනස් වන්නාක් මෙන් වෙනස් වන ස්වාභාවික සංසිද්ධියකි. කලාකරුවා මේ වෙනස දකින්නේ කලාත්මක ස්වරූපයෙනි.



ආචාර්ය පාලිත ගනේවත්ත

ඔබේ සොඳුරු මංගල දිනයේ



ඔබේ සොඳුරු මංගල දිනයේ
අපේ සම්ප්‍රදායික රටාවෙන් හා
නවීන විලාසිතාවෙන්
පිරිපුන් මනාලියක දක්වා හැඩ වීමට

මනාලියන්ගේ මල් කළඹ සැකසීම

ඔබේ සියලුම රූපලාවන්‍ය කටයුතු
එකම තැනකදී පහසු මිලකට

- කාන්තා කොණ්ඩා කැපීම හා කොණ්ඩා මෝස්තර
- ෆර්ම් කිරීම ස්ට්‍රේට් කිරීම කලර් කිරීම
- ටින්ට් කිරීම රිබොන්ඩිං කිරීම
- ෆේෂල් කිරීම වැක්ස් කිරීම
- ත්‍රෙඩින් කිරීම මුහුණ බ්ලීච් කිරීම සම බ්ලීච් කිරීම ඇතුලු සියලුම රූපලාවන්‍ය කටයුතු සඳහා

දස වසරක පළපුරුද්ද සමගින්
උසස් ඩිප්ලෝමාධාරිණී

**ප්‍රෂානි සුරවීර**

*Salon Colour Box*

14 Winterton Close
Epping
**TP 9401 3727 / 0425 805 754**